ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මාගේ අංක : PS/PCA/DCC/06/26 - ii
දිනය : 2023 සැප්තැම්බර් මස 07 වන දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,

**<u>ප්‍රාදේශීය මට්ටමෙන් සංවර්ධන කටයුතු සැලසුම් කිරීමේදී ඒ පිළිබඳව දිස්ත්‍රික් සංවර්ධන කමිටු හා ප්‍රාදේශීය සංවර්ධන කමිටු දැනුවත් කිරීම.</u>**

රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන විසින් දිස්ත්‍රික් මට්ටමින් හා ප්‍රාදේශීය මට්ටමින් විවිධ සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී දිස්ත්‍රික් සංවර්ධන කමිටු හා ප්‍රාදේශීය සංවර්ධන කමිටු දැනුවත් නොකිරීම හේතුවෙන් රාජ්‍ය නිලධාරීන් හා දේශපාලන අධිකාරිය අතර දුරස්ථභාවයක් ඇතිවීමත්, මෙම සියළු පාර්ශව අතර සම්බන්ධීකරණය විධිමත්ව සිදු නොවීමත් හේතුවෙන් දෙපාර්ශවයම විවිධ අපහසුතාවලට ලක්වීමත් සිදුවන බව වාර්තා වී ඇත.

2. එමෙන්ම දිස්ත්‍රික් සංවර්ධන කමිටු හා ප්‍රාදේශීය සංවර්ධන කමිටු සභාපතිවරුන් විසින් ද ගරු ජනාධිපතිතුමන්ට මේ පිළිබඳ නිරන්තරයෙන් පැමිණිලි ඉදිරිපත් කිරීමත්, දේශපාලන අධිකාරිය හා රාජ්‍ය නිලධාරීන් අතර මනා සම්බන්ධීකරණය අවම වීම හේතුවෙන් විවිධ ගැටළු ඇති වීමෙන් සංවර්ධන කටයුතුවලට බාධා ඇති වීමත් කෙරෙහි මාගේ අවධානය යොමු වී ඇත.

3. එබැවින්, මින් ඉදිරියට රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන විසින් දිස්ත්‍රික් මට්ටමින් හෝ ප්‍රාදේශීය මට්ටමින් සංවර්ධන කටයුතු පිළිබඳ සැලසුම් සකස් කිරීමේදී හා ඒවා ක්‍රියාත්මක කිරීමේදී ඒ පිළිබඳව දිස්ත්‍රික් සංවර්ධන කමිටු හා ප්‍රාදේශීය සංවර්ධන කමිටු දැනුවත් කර ඔවුන්ගේ ද සහයෝගය සහිතව මනා සම්බන්ධීකරණයකින් යුතුව කටයුතු කළ යුතු වේ.

ස්තුතියි
මෙයට - විශ්වාසී

ඊ එම් එස් බී ඒකනායක
ජනාධිපති ලේකම්

දුරකථන : +94 11 2354420 ෆැක්ස් : +94 11 2446657
විද්‍යුත් තැපැල : prsec@presidentsoffice.lk